


# අමනුෂ්‍යයන්ගේ විල

දිනුක හිරුෂාන්

විතානගේ ප්‍රකාශන

කතුවරයාගේ වෙනත් නිර්මාණ

* ශාපලත් බෝනික්කා 1,2
* ශාපලත් බෝනික්කාගේ වියරුව
* හිම මත මියැදුණු මිනිසුන්ගේ පලිගැනීම 1,2
* ඝාතනය
* ඩොලර් දසලක්ෂයක් සහ මාරාන්තික කිඹුලෙක්
* ආත්ම වියරුව
* ඔබ සමග රැඳෙමි
* හොල්මන් ගුහාව
* මරණයේ ක්‍රීඩාව
* මංමුලා
* වනගත දියණියකගේ සටහන්
* ගවේෂකයා
* අබිරහස් ගොඩනැගිල්ල
* වනයේ පුත්‍රයා
* වැරැදුණු මාර්ගය
* සමුරායි පාසල
* මළවුන්ගේ කෝපය
* දඬුවම් විදින්නිය
* බූසාන් යන දුම්රිය
* මළවුන්ගේ දිනය
* ශාපලත් තෘණබිම
* අනියම් ප්‍රේමයක අබිරහස
* Accounting ටීචර්
* අබිරහස් දිනපොත
* උමතු චිත්‍රපට රංගනය
* අද්භූත ලාම්පුව
* ශ්‍රෝතික මිථ්‍යාවක අවසානය
* අත්භූත නෞකාව

ළමා කතන්දර

* සූටින් මාටින් 1-14
* සුපර් ශිවා 1,2
* එල්ඩොරාඩෝ රන් නගරය
* ශ්‍රෙක්
* හිතහොද බණ්ඩා

වෙනත් නිර්මාණ

* ගංජා ගැටය
* බූරි F.M
* අන්තර්ජාලය හරහා සිදුකරන මත්ද්‍රව්‍ය ජාවාරම
* යාගය පිළිබඳව බෞද්ධ මතය
* ඉකිබිදිනා මල් කැකුළු

අමනුෂ්‍යයන්ගේ විල
2021 ජුනි
මිල රු - 100 /-
විතානගේ ප්‍රකාශන

පොත ගැන .....

එක හුස්මට කියවාගෙන යා හැකි හොල්මන් කතන්දර මාලාවෙහි තවත් එක් නිර්මාණයක් ලෙස මෙම කෙටි නිර්මාණය හැඳින්විය හැකිය.මෙය 1981 වර්ෂයේදී තිරගත වූ Zombie Lake චිත්‍රපටයෙහි සංක්ෂිප්ත නිර්මාණයකි.මෙවන් සංක්ෂිප්ත නිර්මාණකරණය සඳහා ඔබ දක්වන සහයෝගය අගය කරමි.

පී.වී දිනුක හිරුෂාන්

දු . අ - 0788901715



දෙවන ලෝක යුද්ධයෙන් වසර 20 කට පසු කුඩා ප්‍රංශයේ කුඩා නගරයකින් කතාව ආරම්භ වේ. නගරවැසියන් නගරයෙහි ඇති කුඩා විලක් අබිරහස් විල ලෙස හදුන්වයි.තරුණියන් පිරිසක් විලෙහි දිය නෑමට යන අතර එක්වරම විලෙන් මතුවූ නාසි සොල්දදුවන්ගේ අවතාර එම කාන්තාවන්ට පහර දෙති. පසුව විලෙන් ගොඩට පැමිණෙන එක් නාසි සොල්දදුවෙකුගේ අවතාරයක් නගරයට පැමිණ නගරයෙහි කාන්තාවක් මරා දමා යළි විල වෙතට ගොස් අතුරුදහන් වේ.



මෙම සිදුවීම් පිළිබඳව මෙන්ම විමර්ශනය සඳහා කැටියා මූවර් නම් වූ විමර්ශන නිලධාරියා පැමිණෙන තෙක් නගරයේ නගරාධිපති වූ හොවාර්ඩ් වර්නන් අමනුෂ්‍ය සොල්දාදුවන්ගේ ප්‍රහාරයන්ට එරෙහිව පියවර ගැනීම ප්‍රතික්ෂේප කරයි.




අනතුරුව මුවර් නම් නිලධාරීයා පැමිණ නගරාධිපති මුණ ගැසෙයි. ඔහු මුවර් හට අමනුෂ්‍යයන්ගේ විල පිළිබඳව තොරතුරු අඩංගු පොතක් ලබාදෙයි.

..මෙන්න මේ පොතේ අපේ නගරේ ගැන හැම තොරතුරක්ම තියෙනවා..මේ පොතේ අපේ නගරයේ ඉතිහාසය ලියැවිලා තියෙනවා... ඔහු මුවර් සමගින් පවසන්නට වූයේය.



..දැන් මරණ කීයක් වෙලා තියෙනවද නගරාධිපතිතුමා.. මුවර් විමසන්නට වූයේය.
..විලේ නාන්න ගිය ගැහැණු ළමයි ගැන තොරතුරක් ඇත්තෙම නැහැ..ඒ විල අසලම තමයි ඒ භයානක අමනුෂ්‍ය සොල්දදුවන් ඉන්නේ..ගම්වැසියෝ දැකලා තියෙනවා..පරණ නාසි නිල ඇඳුම් තමයි ඒ අමනුෂ්‍යයෝ ඇඳන් ඉන්නේ .. නගරාධිපතිතුමන් විස්තර කරන්නට වූයේය.



මුවර් නගරාධිපතිතුමන් ලබා දුන් පොත කියවන්නට වූයේය. අනතුරුව ඔවුන් ජර්මානු යුධ සමයේදී නගරයේ ඉතිහාසය සාකච්ඡා කරයි. ඉතිහාස කතාවට අනුව  නාසි සොල්දදුවෙකු විසින් සතුරාගේ වෙඩි පහරින් මියයාමට ඉඩ නොදී නාගරික කාන්තාවක් ආරක්ෂා කිරීම ගැන සදහන් වේ. එම කාන්තාව විසින් වෙඩි වැදීමෙන් තුවාලයට පත් එම සොල්දදුවා හට සෞඛ්‍ය සාත්තු සිදු කරයි.සොල්දදුවා ඇයට පෙන්ඩනය සහිත මාලයක් ලබාදෙයි. අනතුරුව සොල්දදුවා ඇය සමඟ ලිංගිකව හැසිරෙයි.



අනතුරුව සුවය ලද සොල්දදුවා නැවත යුධ බිමට පිටත්ව යයි. පසුව වසර ගණනාවකට පසු කාන්තාව වෙත නැවත පැමිණෙන සොල්දදුවා ඔහුගේ දරු ගැබ පිළිබඳව කාන්තාවගෙන් විමසයි. අනතුරුව තම දියණිය වන හෙලේනා නව යොවුන් වියේදී නගරාධිපති තුමන් අතින් දූෂණයට ලක්ව මිය ගොස් ඇති බව සොල්දදුවා කාන්තාවගෙන් විමසා දැනගනියි.



අනතුරුව සොල්දදුවාගේ දියණිය වන හෙලේනා දූෂණයට ලක් කොට මරා දැමූ නගරාධිපතිගෙන් පලිගැනීමට සොල්දදුවා සහ ඔහුගේ හටයන් පැමිණේ.සොල්දදුවා සහ ඔහුගේ සහයක හමුද හටයන් සියලු දෙනාම නගරාධිපතිගේ නායකත්වයෙන් යුත් නගර වැසියන් විසින් ඝාතනය කරන ලද අතර ඔවුන්ගේ සිරුරු වර්තමානයෙහි අමනුෂ්‍යන් ගැවසෙන විලෙහි බැහැර කරන ලදී.



මෙලෙසින් නගර වැසියන් ඝාතනයට ලක් කරන්නේ මළවුන්ගෙන් නැවත පැමිණි අමනුෂ්‍ය සොල්දදුවන් බව නගරාධිපති පවසයි.
..ඒ වගේම ඒ සොල්දදුවෝ ඝාතනය කරේ..මගේ තාත්තා..එයා තමයි හිටපු නගරාධිපති ..
ඒ සොල්දදුවන්ගේ අවතාර තමයි විලෙන් ගොඩබිමට ඇවිල්ලා තියෙන්නේ ..
නගරාධිපති තවදුරටත් පවසන්නට වූයේය.
පසුව නගරයට පැමිණෙන කාන්තා පැසිපන්දු කණ්ඩායමක් විලට බැස ස්නානය කරයි.එම කාන්තාවන් අමනුෂ්‍ය සොල්දදුවන් විසින් විල පතුලට ඇදගෙන ගොස් පහර දී ඝාතනය කරයි.



මෙම බේදවාචකය පිළිබඳව නගරාධිපති පොලිසියට කතා කරයි. අනතුරුව පොලිස් නිලධාරීන් පැමිණ අමනුෂ්‍ය විල සෝදිසි කරන අතර විලෙන් ගොඩට මතුවන අමනුෂ්‍ය සොල්දාදුවන් පොලිස් නිලධාරීන් සියල්ලක්ම මරා දමයි.
පසුව නගරාධිපති මියගිය හෙලේනාගේ රුවට සමාන දැරියක් සොයාගනියි.එම දැරිය යොදාගනිමින් අමනුෂ්‍ය සොල්දාදුවන් විනාශ කිරීමට නගරාධිපති සැලසුම් කරයි.හෙලේනා මියයන අවස්ථාවේදී ඔහුගේ පියා ගලවාගත් මාලය නගරාධිපතතුමා එම දැරියගේ ගෙලේ පලන්දවයි.අනතුරුව ඔහු එම දැරිය විල වෙතට රැගෙන යයි.



නගරාධිපතිගේ සැලසුම අනුව දරුවාගේ රුව නෙත ගැටුණු අමනුෂ්‍ය සොල්දාදුවන් විලෙන් ගොඩට පැමිණෙන්නට විය. අනතුරුව දැරිය ඇයගේ පෙන්ඩනය සහිත මාලය අමනුෂ්‍ය සොල්දාදුවන්ගේ නායකයා හට පෙන්වයි.ඔහු එය තමාගේ මාලය ලෙස හඳුනාගත් අතර දැරිය ඔවුන්ව පැරණි ලී මෝලක් වෙත රැගෙන යයි.අනතුරුව අමනුෂ්‍ය සොල්දාදුවන් ලී මෝලෙහි සිරගත කරන අතර දැරිය යළි පිටතට පැමිණීමෙන් අනතුරුව නගරාධිපතිගේ නායකත්වයෙන් යුතු නගරවැසියන් විසින් ගිනි තබා ලී මෝල විනාශ කරයි.අමනුෂ්‍ය සොල්දාදුවන් සියලු දෙනා ගිනිබත් වී විනාශ වන්නට විය.

